ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022/01/26 |

පැමිණිලි පාර්ශවය : ඩී.යූ තාබෲ මිය,
අංක : 04, ගාලුපාර,
පිංවත්ත, පානදුර.

වගඋත්තර පාර්ශවය : 01. පො.ප පුෂ්පකුමාර මයා,
ස්ථානාධිපති,
කොට්ඨාශ දූෂණ මර්ධන අංශය,
පොලිස් අධිකාරී කාර්යාලය,
පානදුර.

02. උ.පො.ප නිමල් ජේ. සොයිසා මයා,
පොලිස් ස්ථානය,
පානදුර දකුණ.

03. පො.කො 77780 ජනක සම්පත් මයා,
පොලිස් ස්ථානය,
පානදුර දකුණ.

04. පො.කො 88818 ලක්මාල් මයා,
පොලිස් ස්ථානය,
පානදුර දකුණ.

පැමිණිලි අංකය : **HRC/3702/16, HRC/1582/16**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කර ඇති සිය පැමිණිල්ල මඟින් ප්‍රකාශ කර ඇත්තේ, තම පුතුන් වන මහදුර හිරාන් තාබෲ සහ මහදුර රංගන පුෂ්පික තාබෲ යන අය වගඋත්තරකාර පොලිස් නිලධාරීන් විසින් පදනම් විරහිත චෝදනාවක් මත අත්අඩංගුවට ගත් බවයි. පසුව තමාගේ පොඩි පුතා වන මහදුර රංගන පුෂ්පික තාබෲ බූරු පිටියක් මංකොල්ල කා ඇති බවට සහ බෝම්බයක් ළඟ තබා ගත් බවට සඳහන් කර අධිකරණය වෙත ඉදිරිපත් කර බන්ධනාගාර ගත කළ බවද සඳහන් කර ඇත. තවද, මෙය සිදුකරන ලද්දේ 2016.04.05 වන දින අළුයම බවත්, එහිදී නාඳුනන පිරිසක් තම නිවසට ඇතුළු වී පුතුන් දෙදෙනා නිදා සිටි කාමරයට ගොස් ඔවුන් අවදි කර නිවසින් රැගෙන




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2505541 / 74 | ඊමේල් / மின்னஞ்சல் / e-mail | sechrcsl@gmail.com |
| දුරකථන / தொலைபேசி / Telephone | 94 -11- 2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

ගිය බවත්, පසුව ඔවුන් පසුපස තමා යන විට පොලිස් ජීප් රථයක් නවතා තිබෙනු දුටු අතර, බූරු පිටියක් මංකොල්ල කා තිබීම මත අත්අඩංගුවට ගනු ලබන බවට ඔවුන් විසින් ප්‍රකාශ කර සිටින ලද බවත් පැමිණිල්ලෙන් සඳහන් කර ඇත. මේ සම්බන්ධයෙන් 2016.04.05 වන දින දුරකථනය මඟින් මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කරන ලද බව ද වැඩිදුරටත් දක්වා ඇත.

ඉන් පසු තම පුතාට මිරිස්කුඩු දමා බිම දමාගෙන ඉතා අමානුෂික ලෙස පහරදී ඇති බවත්, එදින සවස 7.30ට පමණ ලොකු පුතාව නිදහස් කළ බවත්, තම බාල පුතාව පානදුර වැල්ල පොලීසියේ සිට පානදුර දකුණ පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත් සඳහන් කර ඇත. මෙසේ අත්අඩංගුවට ගැනීමට හේතුව වශයෙන් සඳහන් කර ඇත්තේ, මීට පෙර ක්‍රිකට් තරඟාවලියකදී ඇති වූ ආරවුලක් බවට පැමිණිල්ල විසින් සඳහන් කරන අතර, පසුව තම බාල පුතාට එරෙහිව ව්‍යාජ චෝදනා ඉදිරිපත් කර ඇති බව ද දක්වා ඇත. එනම්, ඔහුව පාරේදී අත්අඩංගුවට ගත් බවටත් නිවසේ නාන කාමරයේ තිබී බෝම්බයක් සොයාගත් බවට සහ මත්කුඩු තිබූ බවට සඳහන් කරමින් පානදුර මහාධිකරණයේ නඩු පවරා ඇති බවයි.

එසේම, තම නිවසේ නාන කාමරයේ වහලයක් නොමැති බවත්, තමා පදිංචිව සිටිනුයේ තම මහගෙදර වන අතර, එහි තමාගේ සහෝදර සහෝදරියන් ද ජීවත් වන බවත්, තම දියණිය ද දරුවෙකු ලැබීමට සිටි බවත්, නිවස තුළින් බෝම්බයක් සොයා ගත්තා යන්න අසත්‍ය කරුණක් බවත් පැමිණිලිකාරිය වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව තම පුතුන් දෙදෙනා වධහිංසාවට ලක්කිරීම සහ බොරු චෝදනා මත නඩු පැවරීම තුළින් ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට පැමිණිල්ලෙන් සඳහන් කර ඇත.

පැමිණිල්ල විසින් තම පුතුන් දෙදෙනා 2016.04.05 වන දින උදෑසන 5.00 ට පමණ නිවස තුළදී අත්අඩංගුවට ගත් බවට සනාථ කිරීම සඳහා ලාලනී සේනානායක, එම්. හිරාන් තාබ්‍රෑ සහ මහේෂිකා ශ්‍යාමලී තාබ්‍රෑ යන අය විසින් ඉදිරිපත් කරන ලද ලිපි තුනක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

අගතියට පත් රංගන පුෂ්පික තාබ්‍රෑ යන අය විසින් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2016.03.27 වන දින පානදුර රාජකීය විද්‍යාලය හා ශාන්ත ජෝන් විද්‍යාලය අතර පැවැති ක්‍රිකට් තරඟාවලියේදී දෙපාර්ශවය අතර ඇති වූ ගැටුමක් නිරාකරණය කිරීම සඳහා තමාත්, තම සහෝදරයාත් මැදිහත් වූ බවත්, එම නිසා තමාට විරුද්ධව පානදුර පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් දමා තිබූ බවත්ය. එම පැමිණිල්ල සිදුකළ අය විසින් වැල්ලේ පොලීසියේ ඔවුන්ගේ හිතවත් පොලිස් නිලධාරීන්ට පැවසීම මත උදෑසන 5.00 ට පමණ පොලිස් නිලධාරීන් තම නිවසට පැමිණ තමාවත්, තම සහෝදරයාවත් රැගෙන ගිය බවත්ය. පසුව අත්බෝම්බයක් සහ හෙරොයින් සම්බන්ධයෙන් තමාට විරුද්ධව මහාධිකරණයේ නඩුවක් පැවරූ බවත්, අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී අත්අඩංගුවට ගැනීමට හේතුව වශයෙන් ප්‍රකාශ කර සිටියේ බූරුපොලක් මංකොල්ල කෑමක් සම්බන්ධයෙන් වන බවත්, නමුත් මෙම සිද්ධීන් දෙකටම තමාත් තම සහෝදරයාත් සම්බන්ධ නොමැති බවත් සඳහන් කර ඇත. අත්අඩංගුවට ගත් දිනයේ ප.ව 7.30ට පමණ තම සහෝදරයාව නිදහස් කළ නමුත්, තමාව නිදහස් නොකළ බවත්, තමාව නිරුවත් කර අත් පිටුපසට කර මාංචු දමා **ස්ථානාධිපති සමඟ පුෂ්පකුමාර මහතා, සම්පත් මහතා සහ සොයිසා මහතා යන නිලධාරීන් සහ තවත් නාඳුනන පොලිස් නිලධාරීන් තිදෙනෙක් විසින් වරින් වර පොලු වලින් ඔළුවට, යටි පතුල් වලට, තට්ටම් වලට සහ පිටට පහරදුන් බවත්, ස්ථානාධිපතිවරයා විසින් තමාව බිම දමා තමාගේ පපුව පෑගූ බවත්, තමාගේ දෑස් වලට සහ ලිංගික ප්‍රදේශ වලට මිරිස්කුඩු දමා වධ දී හිස් කොළ දෙකකට බලහත්කාරයෙන් අත්සන් ලබාගත් බවත් සඳහන් කර ඇත.**

පැමිණිල්ල විසින් අධිකරණ වෛද්‍ය වාර්තාවේ පිටපතක් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති අතර, එම වාර්තාව අනුව රෝගියාගේ කෙටි ඉතිහාසය තුළ සඳහන් කර ඇත්තේ, '2016.04.04 උදෑසන 5.00 ට පමණ නිවසේ නිදා සිටින විට පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන රාත්‍රී 7.00 ට පමණ නිරුවත් කර අත් පිටුපසට කර මාංචු දමා OIC මහතා, සම්පත් මහතා, සොයිසා මහතා සහ තවත් තිදෙනෙක් හෝස් බට වලින් සහ පොලු වලින් ඔළුවට, යටිපතුල් වලට, කකුල් වලට, පිටට සහ තට්ටම් වලට විටින් විට අවස්ථා තුනකදී පමණ පහරදුන් බවත්, ස්ථානාධිපතිවරයා තමාව බිම දමාගෙන පපුවට පයින් ගැසූ බවත්, හිස් කොල දෙකකට අත්සන් ලබාගත් බවත්ය. එසේම ඇස් වලට සහ මුත්‍රා කරන තැනට මිරිස් දැමූ බවත්' සඳහන් කර ඇත. අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව බරපතල නොවන තුවාල දෙකක් ඇති බවට සඳහන් වේ.

එසේම අධිකරණ වෛද්‍යවරයාගේ මතය වන්නේ අදාළ රෝගියා ඉදිරිපත් කරන ලද රෝග ඉතිහාසය හා සිදුව ඇති තුවාල සැසඳෙන බවයි.

**වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-**

පළවන වගඋත්තරකාර පො.ප පත්මකුමාර මහතා කොමිෂන් සභාව හමුවේ කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2016.04.05 වන දින පො.කො.රි. 80214 ගාමිණී විසින් පදවන ලද WG LF 0591 දරණ කැබ් රථයෙන් උ.පො.ප සොයිසා, පො.සැ 30787 බණ්ඩාර, පො.කො 22809 කරුණාරත්න, පො.කො 68470 කරුණාපාල, පො.කො 77780 ජනක සම්පත්, පො.කො 88817 ලක්මාල් යන නිලධාරීන් සමඟ දූෂණ මර්ධන වැටලීම් සඳහා පිටව ගිය බවයි. එසේ යන විට පානදුර දුම්රිය පළ අසලදී කාන්තාවක් මුණගැසුනු බවත්, එම කාන්තාව විසින්, 'පොඩිකළුවා නැමැති අය තවත් පිරිසක් සමඟ ප්‍රදේශයේ බුරු පිටිවලට පැන බෝම්බ පෙන්වා කඩු පෙන්වා බුරු පිටි මංකොල්ලකන බවට' ප්‍රකාශ කරන ලද බවත්, එසේම එම කණ්ඩායම හෙරොයින් වලට ඇබ්බැහි වූ අය බවට තොරතුරු ලබා දෙන ලද බවත් සඳහන් කර ඇත. තමා විසින් පො.සැ 30787 බණ්ඩාර ලවා එය සටහන් කිරීමෙන් පසුව අදාළ පුද්ගලයන් පදිංචි ප්‍රදේශයේ සංචාරය කළ බවත්, පසුව පින්වත්ත ගාලුපාර ප්‍රදේශයේදී සැකකරුවන්ගේ නිවසට මීටර් 100 ක් පමණ මෙහායින් වාහනය නතර කර පයින් ඒ දෙසට ගිය බවත්, එසේ යන විට ඉහත සඳහන් කළ පුද්ගලයාගේ නිවස ඇති මාර්ගයේ නිවස දෙස සිට පුද්ගලයෙකු තමා සිටින දෙසට පැමිණි බවත්, තමා නිල ඇඳුමින් සිටි අතර, අනෙක් නිලධාරීන් සිවිල් ඇඳුමින් සැරසී සිටි බවත්, පොලිස් රියදුරු වාහනය සිටි බවත් එම පුද්ගලයා ආපසු හැරී දුවන්නට වූ බැවින් ඔහු පසුපස හබාගොස් අල්ලා ගනු ලැබූ බවත් සඳහන් කර ඇත.

අනතුරුව ඔහුගෙන් විස්තර විමසා පරීක්ෂා කිරීමේදී ඔහු හැඳ සිටි කලිසමේ දකුණුපස සාක්කුවේ හෙරොයින් පාර්සලයක් තිබී අත්අඩංගුවට ගත් බවත්, අදාළ අත්අඩංගුවට ගැනීම සිදුකරන ලද්දේ පැය 08.10 ට වන අතර, පසුව කොට්ඨාශ දූෂණ මර්ධන අංශයට ගෙන ගොස් වැඩිදුර ප්‍රශ්න කිරීමේදී ලද තොරතුරු සමඟ වැඩිදුර විමර්ශනය සිදුකළ බවත්, එහිදී සුදු පිටි වලට රැගෙන යන ආයුධ තිබෙන ස්ථානය පිළිබඳව අනාවරණය වීම මත එම තොරතුරු අනුව ඔහුගේ නාන කාමරයේ වහලය උඩ මුදුන් උළු කැට වලින් වසා තිබූ බෝම්බයක් සහ දිග මන්නා පිහියක් සැකකරු සමඟ ගොස් අත්අඩංගුවට ගන්නා ලද බවත්, පසුව ඔහු සමඟ මංකොල්ල කෑමට ගිය අනෙක් කණ්ඩායම පිළිබඳව තොරතුරු අනාවරණය වීමෙන් පසුව ඉතිරි සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට එම ප්‍රදේශයට යන විට ඔවුන් පළාගොස් තිබූ බැවින් මෙම සැකකරුව පානදුර දකුණ පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත් සඳහන් කර ඇත.

මෙහිදී සැකකරු අත්අඩංගුවට ගැනීමට යාමේදී විරෝධය පෑමක් සිදුවූයේද යන්න සම්බන්ධයෙන් කොමිෂන් සභාවේදී කරන ලද විමසීමට අනුව, වගඋත්තරකරු සඳහන් කර ඇත්තේ, අත්අඩංගුවට ගැනීමට යාමේදී විරෝධය පෑමක් සිදුවූ බැවින් අවම බලයක් යොදා සැකකරු අත්අඩංගුවට ගත් බවත්, ඒ විගසම අත් විලංගු ඇමූ බවත්ය. සැකකරුව 2016.04.05 වන දින පැය 08.10 ට අත්අඩංගුවට ගෙන එදිනම පැය 22.30 ට පානදුර දකුණ පොලිස් ස්ථානයේ උපසේවයේ සිටි පො.සැ 9926 රණතුංග යන නිලධාරියාට නඩු භාණ්ඩ සමඟ ඉදිරිපත් කළ බවත් පසුව 2016.04.06 වන දින සැකකරුව පානදුර අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත් සඳහන් කර ඇත.

2 වන වගඋත්තරකාර උ.පො.ප නිමල් ජේ. සොයිසා මහතා ප්‍රකාශ කර ඇත්තේ, 2016.04.05 වන දින පැය 08.10 ට පමණ පො.ප පද්මකුමාර මහතා ඇතුළු කණ්ඩායමක් සමඟ මත්ද්‍රව්‍ය දූෂණ වැටලීමක් සඳහා සහභාගී වූ බවත්, එසේ සහභාගී වන අවස්ථාවේදී ස්ථානාධිපතිතුමාට ලද තොරතුරක් මත පුද්ගලයෙකු පිරිවෙන පාරේ හෙරොයින් ළඟ තබාගෙන සිටින බවට දැනුවත් වීම මත තමා ඇතුළු කණ්ඩායම පිරිවෙන පාරට පැමිණ ජීප් රථය නවතා ඉදිරියට පා ගමනින් එන අවස්ථාවේදී පාරේ සිටි පුද්ගලයෙකු දිවීමට පටන්ගත් බවත්, පසුව පො.ප. පද්මකුමාර මහතා දිවගොස් ඔහුව අත්අඩංගුවට ගත් බවත්, පරික්ෂා කිරීමේදී ඔහු සන්තකයේ තිබී හෙරොයින් අත්අඩංගුවට ගත් බවත්, පොලිස් ස්ථානයට ගෙන ගොස් ප්‍රශ්න කිරීමේදී අනාවරණය වූ තොරතුරු අනුව නිවස තුළ බෝම්බයක් සහ කඩුවක්ද තවත් භාණ්ඩ ද ඇති බව හා එය සැකකරුට පෙන්විය හැකි බවට දැන්වීමෙන් පසුව නැවත ඔහු සමඟ ඔහුගේ නිවසට ගොස් නිවසට අල්ලා ඇති වැසිකිලිය උඩ ස්ලැබ් එකේ මුදුන් උළු කැට යට තිබී කළු පාට බෑගයක් සොයාගත් අතර, එම පාර්සලය ළඟ තිබී කඩුවක් ද, මුහුණු ආවරණ දෙකක් ද සොයාගත බවත්, පසුව පානදුර පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත් සඳහන් කර ඇත. කිසිදු අවස්ථාවක පහරදීමක් නොකළ බවත් එම චෝදනා ප්‍රතික්ෂේප කරන බවත් ප්‍රකාශ කර ඇත. මෙම පුද්ගලයාට මීට පෙර තිබූ බෝම්බ නඩුවකදී අධිකරණයේදී වරද භාරගෙන ඇති බවත්, ඊට අමතරව වාද්දුව පොලිස් බල ප්‍රදේශයේ රන් මාල කඩා ගැනීමක් සම්බන්ධයෙන් චෝදනා ලැබූ පුද්ගලයෙකු බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

3 වන වගඋත්තරකාර පො.කො 77780 ජානක සම්පත් යන අය ප්‍රකාශ කර ඇත්තේ 2016.04.05 වන දින ස්ථානාධිපතිවරයා සමඟ අදාළ වැටලීමට සහභාගී වූ බවයි.

4 වන වගඋත්තරකාර පො.කො 88818 ලක්මාල් යන අය ද ප්‍රකාශ කර ඇත්තේ, 2016.04.05 වන දින අදාළ පුද්ගලයා මත්ද්‍රව්‍ය වරදක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීමට සහභාගී වූ බවයි.

**නිරීක්ෂණ :-**

ඉදිරිපත් වී ඇති කරුණු අනුව රංගන පුෂ්පික තාබෑෂ යන අයව 2016.04.05 වන දින නිවසේදී අත්අඩංගුවට ගෙන ඇති බවත්, 2016.04.06 වන දින අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවත් නිරීක්ෂණය වේ. මෙම අයට විරුද්ධව මේ වනවිට පානදුර මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 36484 යටතේ 1996 අංක 18 දරණ පීඩාකාරී ආයුධ පනතේ 2(1) වගන්තිය යටතේ සහ හෙරොයින් ළඟ තබාගැනීම යටතේ නඩුවක් පවතින බව නිරීක්ෂණය වේ.

එසේම, පැය 24 ක් තුළ අදාළ සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කර ඇති බැවින් එම ව්‍යවස්ථාවේ 13(2) ව්‍යවස්ථාව උල්ලංඝනය වීමක් ද අනාවරණය වී නොමැති බව නිරීක්ෂණය වේ.

අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව බරපතල නොවන තුවාල දෙකක් ඇති බවත්, එහිදී තුවාල ලෙස තදබල මැදූ වීමක් දකුණු දණහිසේ ඇති බවත්, මද මැදූ වීමක් යටි පතුල් වල මතුපිට ඇති බවත්ය.

අධිකරණ වෛද්‍යවරයා තම මතය තවදුරටත් දක්වමින් කියා සිටින්නේ, මෙම තුවාලයන් මොට ආයුධයකින් සිදුකල තුවාල බවත්, ලබාදී ඇති රෝගී ඉතිහාසය වන "හෝස් බට වලින්, පොලු වලින් ඔළුවට, යටි පතුල් වලට, අත් වලට, කකුල් වලට, පිටට සහ තට්ටම් වලට ගැහුවා" යන ප්‍රකාශය හා සැසඳෙන බවයි.

<u>අමල් සුදත් සිල්වා එරෙහිව කොඩිතුවක්කු</u> නඩුවේදී දක්වා ඇති පරිදි කිසියම් තැනැත්තෙකු වධහිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවයි. එසේම 11 වන ව්‍යවස්ථාව මඟින් විධානය කරන්නේ යම් තැනැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකු වෙත වධහිංසාවක්, කෲර හෝ අමානුෂික සැළකීමක් දැක්වීම තහනම් කරනු ලබන බවයි. එසේම, එම අයිතිවාසිකම කිසියම් සීමාවකට හෝ අඩු කිරීමකට යටත් කර නොමැති පරම මූලික අයිතිවාසිකමක් බවයි. එසේම, අපරාධකරුවෙකු වුවද, එසේ නොවුවද රටේ සෑම තැනැත්තෙකුටම මෙම අයිතිවාසිකම ඇති බවත්, මෙම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පොලිස් නිලධාරීන් වුවද කිසියම් අවස්ථාගත කරුණක් යටතේ එම අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම, අඩුකිරීම හෝ සීමා කිරීම නොකළ යුතු බවයි.

තවද, <u>ඉෂාරා අංජලී එරෙහිව වර්ණ බෝගහවත්ත</u> නඩුවේදී 11 වන ව්‍යවස්ථාව තවදුරටත් තහවුරු කර ඇති අතර, අධිකරණයෙන් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් කිසිදු පුද්ගලයෙකු කෲර හෝ අවමන් සහගත සැළකිල්ලකට ලක් නොකළ යුතු බවයි.

වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ අනුව සැකකරු අත්අඩංගුවට ගැනීමට අවම බලයක් යෙදූ බවට පිළිගෙන ඇති බවද නිරීක්ෂණය වන නමුත්, වෛද්‍ය වාර්තා අනුව බලනකල වගඋත්තරකරුවන් අවම බලය ඉක්මවා ගිය බලයක් යොදවා ඇති බව නිරීක්ෂණය වේ. අංක A 20 දරණ දෙපාර්තමේන්තු නියෝගයන්හි පුද්ගලයකු අත්අඩංගුවට ගත් විට එය හැකි තරම් ප්‍රචණ්ඩ ක්‍රියා නොමැතිව සිදු කළ යුතු බවත් ප්‍රචණ්ඩකාරී පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමේදී පොලිස් බලතල භාවිතා කළ යුත්තේ සැකකරුගේ බලය යටපත් කිරීමට අවශ්‍ය ප්‍රමාණයට බවට දක්වා ඇත. ඒ බව <u>නන්දසේන ලලන්ත අනුරාධ නන්දසේන එදිරිව ස්ථානාධිපති අනුරාධපුර හා තවත් අය</u> SCFR 369/2013 නඩුවේදී දක්වා ඇත.

ඉදිරිපත් වී ඇති සමස්ත කරුණු අනුව, අගතියට පත් තැනැත්තා වන රංගන පුෂ්පික තාබෲ යන අයට පහරදීමක් සිදුව ඇති බවට නිරීක්ෂණය වන බැවින්, එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මඟින් සහතික කොට ආරක්ෂා කර දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. ඒ අනුව 1, 2 හා 3 වන වගඋත්තරකරුවන් විසින් අභතියට පත් රංගන පුෂ්පික තාබ්‍රා යන අයට රු. 10,000/ ක මුදලක් ගෙවීමට කටයුතු කළ යුතුය.

02. එසේම පොලිස් නිලධාරීන්ගේ ඉහත ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති සහ නීතිපති වෙත ද යොමු කරනු ලැබේ.

2022.02 . 25 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිනී මාරසිංහ,
(හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු),
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

පිටපත :- 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. නීතිපති,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

සැ.යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැළැස්විය යුතුය.

B/